# ශ්‍රී ලංකාවේ ඉඩම් සහ සංවර්ධන සැලසුම් පිළිබඳ මාර්ගෝපදේශයක්

# ශ්‍රී ලංකාවේ ඉඩම් සහ සංවර්ධන සැලසුම් පිළිබඳ මාර්ගෝපදේශයක්

ඉඩම් හිමිකම් වෙනුවෙන් ජනතා සන්ධානය

© Law & Society Trust and People's Alliance for Right to Land, 2024

ISBN [redacted]

Published by
Law and Society Trust
3, Kynsey Terrace,
Colombo 08,
Sri Lanka
Tel: + 94 (0) 112684845
Fax: +94011-2686843
Email: admin@lstlanka.org
www.lstlanka.org

People's Alliance for Right to Land
Email: parlnetworksl@gmail.com

www.parlsl.com

Printed by Imageway

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නාගරික ඉඩම් සහ සංවර්ධන සැලසුම් අවබෝධ කරගැනීම වෙනුවෙන් තොරතුරු සහ මග පෙන්වීම ලබා දීම මෙම මාර්ගෝපදේශය අරමුණු කරයි. එය ප්‍රධාන කොටස් 5 කින් සමන්විත වේ

1. **ඉඩම් පිළිබඳ අවබෝධය**
   ශ්‍රී ලංකාවේ තිබෙන ඉඩම් වර්ග සහ ඒවා පරිපාලනය කෙරෙන සහ අත්පත් කරගනු ලබන ආකාරය

2. **ප්‍රධාන සැලසුම් වටහා ගැනීම**
   තාක්ෂණික ලිපිලේඛන සහ සංවර්ධන සැලසුම් වටහා ගන්නා ආකාරය

3. **පදිංචිය වෙනස් කිරීමට නියමව**
   ඔබේ ඉඩම අත්පත් කරගනු ලබන්නේ නම් දැන සිටිය යුතු තොරතුරු

4. **තොරතුරු දැනගැනීමේ අයිතිය**
   ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස ඔබ සතු අයිතිය

5. **මුදල් පිළිබඳ සෙවිල්ලෙන් සිටීම**
   සංවර්ධන සැලසුම් සම්බන්ධයෙන් තොරතුරු වෙනුවෙන් වෙනත් මූලාශ්‍ර

මෙම මාර්ගෝපදේශය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නීතිය හා සමාජය භාරය සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් විසින් මෙයට පෙර සකස් කරන ලද මෙවලම් කට්ටල  මූලාශ්‍ර ලෙස යොදාගෙන ඇතිනාගරික සංවර්ධනය සහ ප්‍රධාන සැලසුම් පිළිබඳව තොරතුරු ඉඩම් හිමිකම් වෙනුවෙන් ජනතා සන්ධානය (PARL) වෙනුවෙන් ඉරෝමි පෙරේරා (කලම්බු අර්බන් ලැබ්) විසින් සකස් කරන ලදී.

GCRF-UKRI – (Re-thinking the off-grid city 2019 පර්යේෂණ සහයෝගිත්වය විසින් සපයන ලද අරමුදල් සහාය හේතුවෙන් මෙම මාර්ගෝපදේශය සකස් කිරීමට හැකි විය.

# ශ්‍රී ලංකාවේ නාගරික ඉඩම් පිළිබඳව අවබෝධය ඇතිකර ගැනීම

1

## 1. රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් යනු මොනවාද?



**1) රජයේ ඉඩම්**

රජයේ ඉඩම් යනු රජයට නීත්‍යානුකූල හිමිකම ඇති ඉඩම් හෝ යම් ඉඩමක පිහිටි කවර හෝ ගොඩනැගිල්ලක් සමග එයට සබැඳි සියළු හිමිකම්, බැඳියාවන් හා වරප්‍රසාද සමග රජය විසින් බැහැර කරනු ලැබිය හැකි සියළු ඉඩම් වේ. විවිධ සංස්ථා සහ මණ්ඩල සතු ඉඩම් ද මෙය අයත් වේ. රජයේ ඉඩම් ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම් වලදී අදාල රජයේ නිලධාරීන් විසින් පරිපාලනය කරනු ලැබේ.



**2) පුද්ගලික ඉඩම්**

පුද්ගලික ඉඩම් යනු පූර්ණ හිමිකාරිත්වය පුද්ගලයන් හෝ පුද්ගලික ආයතන සතු ඉඩම් වන අතර සාමාන්‍යයෙන් එබඳු ඉඩම්වල හිමිකාරිත්වය විවිධ වර්ගවල ඔප්පු හරහා පැවරීම කරනු ලැබේ.

## 2. ඉඩම්වලට අදාල වන වැදගත් යෙදුම්

**අදිවාසය:** ඉඩමක ජීවත්වීම හෝ භුක්තිය.

**අනුබැඳුම:** එක් තැනැත්තෙකුගේ දේපල තවත් තැනැත්තෙකුගේ දේපලට යා කරනු හෝ එකතු කරනු ලැබීම.

**කාලාවරෝධය:** යම් තැනැත්තෙකු වෙනත් තැනැත්තෙකුට අයිති ඉඩමක් ගෙවීමකින් තොරව වසර දහයක කාලපරිච්ඡේදයක් භුක්ති විඳි විට හා එම ඉඩම භුක්ති විඳීම බාධාවකින් තොරව සහ අඛණ්ඩව සිදු වූ විට, එම ඉඩම භුක්ති විඳින තැනැත්තාට ඉඩමේ නෛතික අයිතියට හිමිකම් පෑමේ හැකියාව ඇත.

**මිලට ගැනුම:** පුද්ගලික ඉඩම් හිමිකරුවන් විසින් ඉඩම් විකුණනු ලැබීමට සහ ඔවුන් වෙතින් ඉඩම් මිලට ගනු ලැබීමට හැකිය. දේපල ඔප්පුවක් මගින් පවරනු ලබන්නේ නම් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හමුවේ සාක්ෂි කරුවන් ඉදිරිපිට ඔප්පුව අත්සන් කරනු ලැබ එය එම ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ විට පමණක් ඉඩම් විකිණීමක් වලංගු වේ. විකුණුම් ලේඛන සත්‍ය, අව්‍යාජ සහ නිවැරදි බවට ප්‍රසිද්ධ නොතාරිස්වරයා සහතික කළ යුතුය. ලේඛන වලට වෙනත් ලේඛන අභිභවා ප්‍රමුඛත්වය ලබා දීම පිණිස ඒවා අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ හැකිය. ඉඩමක් විකිණීමකදී මුද්දර ගාස්තු ගෙවිය යුතුයි මුද්දර ගාස්තු ප්‍රමාණය කලින් කලට වෙනස් වන අතර එය මිලට ගන්නා විසින් ගෙවනු ලැබිය යුතුය.

**උරුමය: අන්තිම කැමති පත්‍රයක් සහිතව:** යම් තැනැත්තෙකු අන්තිම කැමති පත්‍රයක් ලියා තබා මිය ගිය විට හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැති විට පවා, බූදලයේ වටිනාකම රු. 4,000,000/- ඉක්මවන්නේ නම් දිස්ත්‍රික් අධිකරණය විසින් උරුමය තීරණය කරනු ලැබීම නීතියට අනුව අවශ්‍ය වේ.

**උරුමය: අන්තිම කැමති පත්‍රයක් නොමැතිව:** පුද්ගලයන් අන්තිම කැමති පත්‍රයක නම් කරනු ලැබ සිටී නම් ඔවුනට පුද්ගලික ඉඩම් ලැබීමේ හැකියාව ඇත. යම් තැනැත්තෙකු අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය ගිය විට ඉඩම් උරුම විය යුත්තේ කවුරුන් හටද යන්න පාලනය වන නීති තිබේ. උදාහරණයක් ලෙස, එම තැනැත්තාගේ කලත්‍රයා සහ දරුවන් ජීවත්ව සිටී නම්, දේපල වලින් අඩක් කලත්‍රයාට හිමි වන අතර ඉතිරි අඩ දරුවන්ට හිමි වේ.

**පරිත්‍යාග:** නිරූපිත නීතිවලට අනුකූලව ඉඩම් තැනැත්තෙකුට හෝ සංවිධානයකට පරිත්‍යාග කිරීමේ හැකියාව ඇත.

## 3. රජයේ ඉඩම්



රජයේ ඉඩම් පුරවැසියන්ට ලබා දිය හැකි ආකාරය (රජයේ ඉඩම් අන්සතු කිරීම), ලබා දෙන ලද ඉඩම් මත රාජ්‍යයට සහ පුරවැසියාට ඇති හිමිකම් සහ මිනිසුන් රජයේ ඉඩම් අයුතු ලෙස අල්ලා ගත් විට රජයට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සරල අවබෝධයක් මෙම කොටස ලබා දෙයි.

මෙම කොටසේ සඳහන් වන නීති වලට අමතරව අදාලවන තවත් නීති තිබේ.

### 3.1 රජයේ ඉඩම් අන්සතු කරනු ලබන්නේ කෙසේද?



**බලපත්‍රයක් මගින්**



**ප්‍රදානයක් මගින්**



**බදු දීමෙන්**



**ජනාධිපතිවරයා විසින්**

### බලපත්‍රය

1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනත ඇතුළු නීති ගණනාවක් යටතේ බලපත්‍ර නිකුත් කරනු ලැබේ. අඩු ආදායම් ලාභීන් හෝ ඉඩම් නොමැති තැනැත්තන් වැනි අදාල නීතිවල නිශ්චිතව දක්වනු ලැබ ඇති විශේෂිත කාණ්ඩවලට අයත් තැනැත්තන්ට බලපත්‍රයක් ලබා දීම් හැකියාව ඇතී සාමාන්‍යයන් බලපත්‍ර ලබා දීම එම නීතියේ හා/හෝ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව සිදු වේ.

සාමාන්‍යයන්, බලපත්‍ර හිමියන්ට වාසස්ථානයක් ලෙස හා/හෝ වගා කටයුතු වෙනුවෙන් ආදී වශයෙන් එම බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ආකාරයට ඉඩම භාවිතා කළ හැකිය. බලපත්‍ර දරන්නන් නාමික මාසික කුලියක් රජයට ගෙවීම අවශ්‍යයීවාර්ෂික බලපත්‍රයක් ආකාරයට හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන විට LDO බලපත්‍ර ලෙස හැඳින්වෙන බලපත්‍රයක් ආකාරයටද බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකිය.

බලපත්‍රයක් යටතේ කවර හෝ දේපලක් දරන කවර හෝ තැනැත්තෙකුට එම දේපල බැහැර දිය නොහැකි බවත් එබඳු බැහැර දීමක් වලංගු නොවන බවත් ඉඩම් සංවර්ධන ආඥාපනත ප්‍රකාශ කරයි. යාවජීව දරන්නෙකු (හිමිකරුගේ මරණින් පසු දේපලට අනුප්‍රාප්තිය ලබන්නෙකු) හා/හෝ අනුප්‍රාප්තිකයකු (හිමිකරු හෝ යාවජීව දරන්නා මරණයට පත්වීමේදී හෝ යාවජීව

දරන්නාට හිමිකරුගෙන් අනුප්‍රාප්තිය ලැබීමට අසමත්වන අවස්ථාවකදී අනුප්‍රාප්තිය ලබන තැනැත්තකු) නම් කිරීමට බලපත්‍රයක හිමිකරුට හැකියාව ඇත.

## ප්‍රදානය

ස්වර්ණභූමි, ජයභූමි, රණභූමි සහ රන්බිම ලෙස හැඳින්වෙන ඔප්පු මගින් ඉඩම් ප්‍රදාන සිදු කිරීමට රජයට හැකියිප්‍රදාන දරන්නන්ට ඔවුන්ගේ ඉඩම මත පරම හිමිකම තිබෙන අතර ප්‍රදානය දරන්නා ඉඩමේ අයිතිකරු බව එයින් අදහස් වේ.

බලපත්‍ර තිබෙන තැනැත්තන් නිශ්චිත කොන්දේසි සැපිරුවහොත් ඔවුන්ගේ බලපත්‍ර ප්‍රදාන බවට පරිවර්තනය කරනු ලැබිය හැකිය.

ආඥාපනතේ උපලේඛනයෙහි නියම කරනු ලැබ ඇති කොන්දේසි වලට යටත්ව සහ හිමිකරු පදිංචි වී සිටිය යුතු බවට කොන්දේසියක් ඇතුළුව තනි ප්‍රදානයකට හෝ සිද්ධි පංක්තියකට හෝ කාණ්ඩයකට අදාල වන ලෙස ආණ්ඩුවේ ඒජන්තවරයා විසින් පනවනු ලබන කවර හෝ විශේෂ කොන්දේසි වලට යටත්වද ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ප්‍රදාන ලබා දීමේ හැකියාව පවතී. එබඳු කොන්දේසි ඉඩම හා බැඳී පවතින අතර ඒවා මුල් ප්‍රදාන ලාභියා පමණක් නොව කුමන හෝ  අනාගත හිමිකම් දරන්නන්ද බැඳීමට යටත් කරනු ඇත.

## බද්ද

1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥාපනත යටතේ පදිංචිය වෙනුවෙන් හෝ කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයන් වෙනුවෙන් පුද්ගලයන් සහ ආයතන වෙත වසර 30 ක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් බදු බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකියිවිශේෂ ව්‍යාපෘති වෙනුවෙන් බදු කාලසීමාව වසර 50 දක්වා දීර්ඝ කරනු ලැබිය හැකිය. මුල් බදු කාලසීමාව සතුටුදායක ලෙස අවසන් වීමේදී, බදු කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකියිඉඩම් කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය සහිතව මෙම බලපත්‍ර පැවරීම හෝ උකස් කිරීම සිදු කරනු ලැබිය හැකිය.

## ජනාධිපතිවරයා විසින්

ජනාධිපතිවරයාට පුණ්‍ය, අධ්‍යාපනික, ආගමික, විද්‍යාත්මක හෝ වෙනත් කවර හෝ කාර්යයන් වෙනුවෙන් රජයේ ඉඩම් ප්‍රදානය කිරීම හෝ නාමික මිලකට බදු දීම හෝ කුලියට දීම සිදු කළ හැකිය.

### ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA)

නිවාස සංවර්ධනය වෙනුවෙන් පුද්ගලයන්ට ඉඩම් ලබාදෙන වැඩසටහන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇත. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සපයන ලද නිවාස වල ජීවත්වන තැනැත්තන් සැලකීමේදී, ඉඩමේ අයිතිය තවදුරටත් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව පවතින අතර අධිකාරිය විසින් නියම කරනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව පදිංචිව සිටින්නාට නිවසට භුක්තිය හිමිකම් ඇත.

### නාගරික සංවර්ධන අධිකාරිය (UDA)

නාගරික සංවර්ධන අධිකාරිය මෑත කාලයේදී රජයේ ඉඩම්වල බද්ධ නිවාස සංවර්ධනය කිරීමේ සහ සංවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස නෙරපන ලද හෝ නැවත පදිංචි කරනු ලබන පවුල්වලට බද්ධ නිවාස බෙදා දීම හා සම්බන්ධ වී ඇතීඑබඳු නිවාස ලද තැනැත්තන් බද්ධ නිවාසයේ හිමිකාරීත්වයේ ස්වභාවය තක්සේරු කිරීම සඳහා නිවාස සංවර්ධන අධිකාරිය සමඟ අත්සන් තබන ලද ලේඛන පරීක්ෂා කර බැලිය යුතු වේ. ගිවිසුමක් නොමැති නම්, තත්ත්වය පැහැදිලි කරගෙන අන්‍යෝන්‍යව එකඟ වන ලද සහ අවබෝධ කරගන්නා ලද කොන්දේසි සහ හිමිකම් ස්වභාවය මත පදනම්ව ලේඛනයක් ලබා ගැනීම වැදගත්ය.

## 3.2 රජයේ ඉඩම් නීතිය මගින් ආරක්ෂා කරනු ලබන්නේ කෙසේද?

- රජයේ ඉඩම් වලට කිසිදු තැනැත්තෙකුට කාලාවරෝධ හිමිකම් පෑම කළ නොහැකි මෙයින් අදහස් වන්නේ යම් තැනැත්තෙකු හුදෙක් වසර ගණනාවක් හෝ පරම්පරා ගණනාවක් පවා රජයේ ඉඩමක ජීවත්ව ඇති නිසා එම තැනැත්තාට එම රජයේ ඉඩමට කිසිදු හිමිකම් පෑමක් කළ නොහැකි බවයි.
- බලපත්‍රයක් දරන්නෙකුට ඔවුන්ගේ ඉඩම් විකිණිය නොහැක. ඔවුනට එය නීත්‍යානුකූලව පැවරීම පමණක් කළ හැකියිබලපත්‍රයක් හෝ ප්‍රදානයක් දරන්නෙකුට ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව ඔවුන්ගේ ඉඩම් පැවරීම කළ නොහැක. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව පැවරීමකදී පවා, මුල් බලපත්‍ර දරන්නා හෝ ප්‍රදාන දරන්නා මත පනවන ලද කොන්දේසි සහ සීමාවන් තවදුරටත් අදාල වනු ඇත.
- බලපත්‍රයක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන්, නම් කිරීමක් (අනුප්‍රාප්තිකයෙකු හෝ යාවජීව දරන්නෙකු) නොමැති නම්, එවිට එම බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් නීතියක් යටතේද, එම නීතියට අනුකූලව ප්‍රදානය සාරෝපණය වේ.

## 3.3 පැහැදිලි ලිඛිත බලය පැවරීමකින් තොරව රජයේ ඉඩමක අදිවාසයේ ප්‍රතිවිපාක තත්ත්වය/නෛතික හිමිකම්

ඔබ රජයේ ඉඩමක සිටී නම් සහ රජයේ ඉඩමේ ඔබේ පදිංචිය පිළිගන්නා පැහැදිලි ලිඛිත බලය පැවරීමක් ඔබ සතුව නොමැති නම්, ඔබ 'අනවසර පදිංචිකරුවකු. ලෙස සලකනු ලැබීමට ඉඩ ඇතීඅධිකරණ නියෝගයක් මගින් එබඳු ඉඩමකින් හෝ ගොඩනැගිල්ලකින් ඔබව ඉවත් කිරීමට රජයට බලය ඇත.

**පදිංචි වී සිටින්නන් නෙරපීමේ/ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටිය**


රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ ) පනත රජයේ ඉඩම්වල අනවසර සන්තකය හෝ පදිංචිය සහිත තැනැත්තන් වෙතින් ඒවායේ සන්තකය ආපසු ලබා ගැනීම වෙනුවෙන් විධිවිධාන සලස්වයි.

රජයේ බලධරයා රජයේ ඉඩමේ පදිංචිව සිටින තැනැත්තාට එම පරිශ්‍රයෙන් ඉවත් වන ලෙස දැනුම් දෙමින් පිටවීමේ දැන්වීමක් ලබා දිය යුතුයිඑම ඉඩම සත්‍ය වශයෙන්ම රජයේ ඉඩමක්ය  සහ එබඳු දැන්වීමකට එරෙහිව බලධරයාට කිසිදු විරෝධය පෑමක් හෝ කරුණු දැක්වීම් කළ නොහැකිය යන බවට බලධරයාගේ මතය මත පදනම්ව පිටවීමේ දැන්වීම නිකුත් කෙරේ. පිටවීමේ දැන්වීමක් ලබන තැනැත්තෙකු එම දැන්වීමේ සඳහන් දිනට පරිශ්‍රය හිස් කළ යුතු නමුත් එසේ ඉවත් වීම සිදු කිරීමට අවම වශයෙන් දින 30 ක කාලසීමාවක් ලබා දීම සිදු වේ.

යම් තැනැත්තෙකු පිටවීමේ දැන්වීමට අනුකූල වීමට අසමත් වන්නේ නම්, රජයේ නියෝජිත ආයතනයට මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් නෙරපීමේ නියෝගයක් අයැදුම් කළ හැකියිමෙම අවස්ථාවේදී, පදිංචි කරුවන් ඉඩමෙන් නෙරපනු නොලැබීමට හේතු දැක්වීමට ඔවුනට අවස්ථාව ලබා දීම සිදු වේ. අධිකරණය විසින් පිළිගනු ලබන එකම වලංගු හේතුව වන්නේ ඔබට සන්තකයට හිමිකම තිබීම හෝ එය පුද්ගලික ඉඩමක් වීම පමණිරජය විසින් කිසිවක් ඔප්පු කරනු ලැබීම අධිකරණය අපේක්ෂා නොකරයි.

විරෝධතා වලංගු නොවන බවට අධිකරණය තීන්දු කළහොත්, අධිකරණය නෙරපීම් නියෝග යක් ලබා දෙනු ඇති අතර පදිංචි කරුවා ශාරීරිකව ඉවත් කරන ලෙස පිස්කල් නිලධරයාට හෝ පොලීසියට නියෝග කෙරෙනු ඇත.

## 4. පුද්ගලික ඉඩම්



### 4.1 පුද්ගලික ඉඩම් අයිතිය දැරීම

මිලට ගැනීම, ත්‍යාග, උරුමය සහ කාලාවරෝධය ඇතුළු ආකාර ගණනාවකින් යම් තැනැත්තෙකුට පුද්ගලික ඉඩම් අයිතිය ලබා ගත හැකිය.

ඉඩම අත්පත් කර ගැනෙන විවිධ ක්‍රම වලට අදාල වෙනස් ලිපිලේඛන ඇත.

අයිතිය ලබා ගැනීමේ ක්‍රමය සහ ලිපිලේඛන කුමක් වුවත්, සියළු ඉඩම්වල තොරතුරු ප්‍රදේශයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ජනතාවට ලබා ගත හැකියීමෙසේ වන්නේ නීතිය යටතේ ඉඩම් හා සම්බන්ධ සියළු ලිපිලේඛන ලියාපදිංචි කළ යුතු බැවිනි.

ඔබ සිටින ඉඩමේ අයිතියේ ස්වභාවය හෝ එහි පදිංචි වීමට ඔබට ඉඩ සැලසුණු ආකාරය ඔබ නොදනී නම්, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හිමිකම් සොයා බැලීමක් කිරීමට ඔබට නීතිඥවරයෙකුගේ සහාය ලබා ගත හැකිය.

### 4.2 'ඔප්පුවක්' යනු කුමක්ද?

මෙය පුද්ගලික ඉඩමකට හිමිකම ලබාදෙන නෛතික ලේඛනයකි. වලංගු ඔප්පුවක් ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් ලියා අත්සන් කරනු ලැබිය යුතුය. මෙම මාර්ගෝපදේශයේ පසුව සාකච්ඡා කෙරෙන හිමිකම ලියාපදිංචිය සමඟ මෙය වෙනස් වනු ඇත.

### 4.3 ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් ඔප්පුවක් ලියා අත්සන් කරන ලද බවට සැලකෙන්නේ කුමන අවස්ථාවකද?

පහත සඳහන් දේ සිදු වූ විට ඔප්පුවක් ලියා අත්සන් කරන ලද සේ සලකනු ලැබේ:

- තමන් ඉදිරියේ ඇති ලේඛනය සත්‍ය, නිවැරදි සහ අව්‍යාජ බවට ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරනු ලැබූ විට.
- ප්‍රසිද්ධ නොතාරිස්, ලියා අත්සන් කරන්නන් සහ සාක්ෂිකරුවන් එකිනෙකා ඉදිරිපිටදී අත්සන් කරනු ලැබූ විට.
- අනෙකුත් ඔප්පු අභිභවා එයට ප්‍රමුඛත්වය ලබා දීමට ඔප්පුවක් අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය.

### 4.4 ඔප්පු වර්ග

ඔබ සතු ඔප්පු වර්ගය හඳුනා ගන්නීඔප්පු, අන්තිම කැමති පත්‍ර සහ කොඩිසිල මගින් ඔබේ දේපල අයිතිය පවරනු ලැබේ. පහත දැක්වෙන ඔප්පු වර්ග මගින් ලියා පවරාදීම කළ හැකිය.

#### පැවරීම් ඔප්පුව

පැවරුම්කරු ඔප්පුවට අත්සන් තැබිය යුතු අතර සාක්ෂිකරුවන් දෙදෙනා අත්සන් තැබීමෙන් පසුව නොතාරිස්වරයා විසින් එය සහතික කරනු ලැබේ.

පැවරීම් ඔප්පුවක් යනු එක් තැනැත්තෙකුට අයිති දේපලක් තවත් තැනැත්තෙකුට විකුණනු/පවරනු ලබන අවස්ථාවක පිළියෙල කරනු ලබන ඔප්පුවකි. පැවරුම් කරුගේ (විකුණන්නා) සහ පැවරුම් ලාභියාගේ (මිලට ගන්නා) නම්, ලිපින සහ ජාතික හැඳුනුම්පත් අංක;පැවරුම් කරුට හිමිකම මාරු කරන ලද කලින් ඔප්පුව පිළිබඳ විස්තර;සහ ප්‍රතිෂ්ඨාව (විකුණුම් මිල) ඔප්පුවේ අඩංගු විය යුතුය.

#### තෑගි ඔප්පුව

කවර හෝ මුදල්මය ප්‍රතිෂ්ඨාවක් නොමැතිව එක් තැනැත්තෙකු (ත්‍යාග දායකයා) වෙතින් තවත් තැනැත්තෙකුට (ත්‍යාග ලාභියා) දේපල පවරනු ලබන විට තෑගි ඔප්පුව භාවිතා කරනු ලැබේ

#### ප්‍රකාශන ඔප්පුව

කවර හෝ තැනැත්තෙකු කවර හෝ දේපලකට හිමිකම් පෑමට හෝ අයිතිවාසිකම ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එබඳු අයිතිවාසිකමට හෝ හිමිකම් පෑමට නෛතික පදනම ලබා දීම සඳහා ප්‍රකාශන ඔප්පුවක් ලියා අත්සන් කරනු ලැබිය හැකිය.

යම් තැනැත්තෙකුට තවත් තැනැත්තෙකුගේ අයිතිවාසිකමට එරෙහිව දේපලක බාධාවකින් තොර හා අඛණ්ඩ සන්තකය වසර දහයකට වැඩි කාලයක් තිබී ඇති විට එබඳු තැනැත්තෙකුට ප්‍රකාශන ඔප්පුවක් ලියා අත්සන් කර තමන් එම දේපලට කාලාවරෝධී හිමිකම ලබාගෙන ඇති බව ප්‍රකාශ කළ හැකියි එබඳු අවස්ථාවක නොතාරිස්වරයෙකුට ප්‍රකාශක විසින් සනත්කය පිළිබඳ කරන ප්‍රකාශය ප්‍රායෝගිකව සත්‍යාපනය කළ නොහැකි අතර එබැවින් පූර්වාරක්ෂක ක්‍රියාමාර්ගයක් ලෙස නොතාරිස් වරයා සන්තකයේ කාලසීමාව හා සබැඳිව කරුණු දක්වන දිවුරුම් ප්‍රකාශයක් ප්‍රකාශකගෙන් ලබා ගැනීම නුවණට හුරුය.

යම් තැනැත්තෙකු තම ජීවිත කාලය තුළ කුමන හෝ අන්තිම කැමති පත්‍රයක් හෝ තෙස්තමේන්තුවක් ලියා අත්සන් නොකර මිය ගියහොත්, ප්‍රතිලාභීන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමට ප්‍රකාශන ඔප්පුවක් ලියා අත්සන් කිරීමේ හැකියාව ඇති ප්‍රතිලාභීන්ගේ අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමට ප්‍රකාශන ඔප්පුවක් ලියා අත්සන් කරනු ලැබිය හැකිය.

එබඳු ඔප්පුවල, කලින් ලියාපදිංචි කිරීම්වල විස්තර තිබේ නම්, ඒවා අදාල වෙළුම් සහ පත් ඉරු(පිටු) වල ලියාපදිංචි කරනු ලැබිය හැකියි කාලාවරෝධී හිමිකම වෙනුවෙන් ප්‍රකාශන ඔප්පුවක කලින් ලියාපදිංචිය සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් නොමැති නම්□ එය අළුත් පත් ඉරුවක ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

## අන්තිම කැමති පත්‍රය

අන්තිම කැමති පත්‍රය යනු යම් තැනැත්තෙකු (තෙස්තමේන්තුකරු) ජීවිත කාලය තුළ උපයා ගත් දේපල ඔහුගේ/ඇයගේ මරණින් පසු බැහැර කරනු ලැබිය යුතු ආකාරය ප්‍රකාශ කරමින් සිදු කෙරෙන අවසන් ප්‍රකාශය වේ. යම් තැනැත්තෙකු අන්තිම කැමති පත්‍රයක් ඉතිරි කරමින් මිය ගිය විට, අනුප්‍රාප්තියට අදාල සියළු නීති අභිභවා අන්තිම කැමති පත්‍රයට ප්‍රමුඛත්වය ලැබේ.

## කොඩිසිලය

කොඩිසිලය යනු තෙස්තමේන්තුකරු  අන්තිම කැමති පත්‍රයෙහි අන්තර්ගතයට එකතු කරමින් හෝ එය වෙනස් කරමින් සකස් කරන පරිපූර්ය ඔප්පුවකි.

### 4.5 'හිමිකම් ලියාපදිංචිය' යනු කුමක්ද?

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම් හිමිකම් ප්‍රදානය කළ හැකියීමෙය 1998 දී හඳුන්වාදෙන ලද, ගම්පහ, මීගමුව, රත්නපුර, ගම්පොළ, අනුරාධපුර, හෝමාගම,කුරුණෑගල, මහනුවර, හම්බන්තොට සහ යාපනය වැනි ප්‍රදේශ කිහිපයක ක්‍රියාත්මක සහ රටේ ඉතිරි ප්‍රදේශවලට ව්‍යාප්ත කෙරෙනු ඇති ක්‍රමයකි. හිමිකම් ලියාපදිංචිය, ඔප්පු වලට වඩා ලාබ,වඩා පැහැදිලි හිමිකම් ක්‍රමයක් සහතික කරයි.

### 4.6 රාජ්‍යය පුද්ගලික ඉඩම් අත්පත් කරගන්නේ කෙසේද?

ඉඩම් විෂය භාර අමාත්‍යවරයාට නීතියට අනුව ( උදා. ඉඩම් අත්පත් කරගැනීමේ පනත, නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත) පොදු කාර්යයක් වෙනුවෙන් පුද්ගලික ඉඩම් අත්පත් කරගැනීමේ හැකියාව ඇත.

එමෙන්ම ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා වලටද පුද්ගලික ඉඩම් අත්පත් කරගැනීමට බලය ඇත.

ප්‍රාදේශීය සභා පනත, නගර සභා ආඥාපනත සහ මහ නගර සභා ආඥාපනත, පොදු කාර්යයන් වෙනුවෙන් අවශ්‍ය වන කවර හෝ දේපලක අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ එම අත්පත් කර ගැනීම මගින් ඔහුගේ/ඇයගේ නෛතික හිමිකම් උල්ලංඝනය කරනු ලැබීමට ලක්වන කවර හෝ තැනැත්තෙකුට නිසි වන්දි ගෙවීම මගින් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව එබඳු කාර්යයන් වෙනුවෙන් ඉඩම් හෝ ගොඩනැගිලි අත්පත් කරගැනීමට බලය ලබා දෙයි.

### ඉඩම් අත්පත් කරගැනීමේදී රාජ්‍යය පිළිපැදිය යුතු පොදු කරුණු කිහිපයක් වන්නේ:

- අත්පත් කරගැනීමේ අභිප්‍රාය දැන්වීම
- විරෝධතා භාර ගැනීම සහ ඒ පිළිබඳ තීන්දු කිරීම
- ඉඩම් අත්පත් කර ගනු ලබන තැනැත්තන්ට වන්දි
- ඉහත සියළු පියවර අනුගමනය කරනු ලැබිය යුතු බැවින්, රාජ්‍යය ජනතාවට සාධාරණ ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතුය

ඉඩම් අත්පත් කර ගැනීමේදී රාජ්‍යය අනුගමනය කළ යුතු බවට වෙනස් නීති 3 ක් යටතේ නියම කරනු ලැබ ඇති ක්‍රියාපටිපාටි පහත විස්තර කෙරේ.

### ඉඩම් අත්පත් කරගැනීමේ පනත

යම් ඉඩමක් පොදු කාර්යයක් වෙනුවෙන් සුදුසු/අවශ්‍ය බවට අමාත්‍යවරයා සලකන අවස්ථාවක□එම ඉඩමේ අයිතිකරු හෝ අයිතිකරුවන්ට දැන්වීමක් කිරීමට සහ එම දැන්වීම ඉඩමේ හෝ එම ඉඩම ආසන්නයේ පැහැදිලිව පෙනෙන ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට ඔහු කටයුතු සැලැස්විය යුතුය.

එම දැන්වීම;

අ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් විය යුතුය;

ආ) අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉඩමේ විස්තරයක් අඩංගු එකක් විය යුතුය;

ඇ) පොදු කාර්යයක් වෙනුවෙන් එම ඉඩම අත්පත් කර ගැනීමට රජය අපේක්ෂා කරන බවත්, අපේක්ෂිත අත්පත් කර ගැනීමට ලිඛිත විරෝධතා දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කරනු ලැබිය හැකි බවත් සඳහන් කළ යුතුය.

ඈ) එබඳු විරෝධතා ගොනු කිරීම සඳහා නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහන් කළ යුතු අතර එම කාලපරිච්ඡේදය දැන්වීම සිදු කිරීමේ සිට දින දාහතරකට නොඅඩු කාලපරිච්ඡේදයක් විය යුතුය.

විරෝධතා සලකා බැලීමෙන් පසුව, අමාත්‍යවරයා තෘප්තිමත් වන්නේ නම්, නීතිය මගින් නියම කරනු ලැබ ඇති නිර්ණායක වලට අනුව එකී ඉඩම අත්පත් කර ගත යුතු බවට ඇයට/ඔහුට ප්‍රකාශයක් කළ හැකියි එම ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ. ඉන්පසු මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉඩමේ මිනුම් කටයුතු සිදු කරනු ලැබේ. ඉඩම රු.500/- වැඩි ගණනකට තක්සේරු කරනු ලැබූ පස, දැන්වීම පුවත්පත් වල පළ කෙරෙන අතර දැන්වීම ඉඩමේද ප්‍රදර්ශනය කෙරේ. එවිට ඉඩමට හිමිකම් ඇති තැනැත්තන්ට වන්දි තක්සේරු කිරීම සඳහා අත්පත් කරගැනීමේ නිලධාරී ඉදිරියේ පෙනී සිටිය හැකිය.

### ඉඩමඅධිග්‍රහණ පනත

මෙම පනත යටතේ නිසි බලධරයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඕනෑම රජයේ නිලධාරියෙකුට, ජනාධිපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව පහත දැක්වෙන කරුණු වෙනුවෙන් අවශ්‍ය කුමන හෝ ඉඩමක් සන්තකයට ගැනීම හෝ සන්තකයට ගැනීම වේගවත් කිරීමට අවශ්‍ය ලිඛිත නියෝග ලබා දීමට  හැකියාව ඇත:

අ) ප්‍රජාවේ දිවි පැවැත්ම වෙනුවෙන් අත්‍යවශ්‍ය සැපයුම් හෝ සේවා පවත්වාගැනීමේ කාර්යය වෙනුවෙන්.

ආ) අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ආනයනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම වෙනුවෙන් ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද කුමන හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය වෙනුවෙන්.

ඇ)  සන්නද්ධ හමුදා හෝ කවර හෝ බාහිර හමුදාවක් විසින් භාවිතා කරනු ලැබීමේ හෝ අත්කර ගනු ලැබීමේ කාර්යයන් වෙනුවෙන්.

### නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

ජනතාවගේ පොදු සුබසාධනයේ සාධාරණ අවශ්‍යතා ඉටු කරන නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීමේ කාර්යය වෙනුවෙන් හදිසියේ අවශ්‍ය වන කවර හෝ ඉඩමක් හෝ කවර හෝ ප්‍රදේශයක් ජනාධිපතිවරයාට ප්‍රකාශයට පත් කළ හැකියිනාගරික සංවර්ධනය භාරව සිටින අමාත්‍යවරයාගේ විසින් කරනු ලබන නිර්දේශයක් මත  පදනම්ව  මෙම ප්‍රකාශයට පත් කිරීම කරනු ලැබේ.

### 4.6 රාජ්‍යය පුද්ගලික ඉඩම් අත්පත් කරගන්නේ නම් වන්දි ප්‍රදානය කරනු ලබන්නේද?

ඔව්.

අත්පත් කරගැනීමේ නිලධාරී විමර්ශනයකින් පසු වන්දිය තක්සේරු කළ යුතුයිඉඩමේ වෙළඳපොල වටිනාකම මත පදනම්ව වන්දිය තක්සේරු කරනු ලැබේ. අත්පත් කරගැනීමේ නිලධාරීගේ තීරණය පිළිබඳව හිමිකම් කියන්නා තෘප්තිමත් නොවන්නේ නම්, වන්දි ප්‍රදානය පිළිබඳව දැනුම් දීමේ සිට දින 21 ක් ඇතුළත සමාලෝචන මණ්ඩලයකට අභියාචනයක් කිරීමේ හැකියාව ඇති දිස්ත්‍රික් උසාවියට සහ අභියාචනා අධිකරණයට තවදුරටත් අභියාචනා කිරීමේ හැකියාව පවතී.

# ප්‍රධාන සැලසුම් අවබෝධ කරගැනීම



ප්‍රධාන සැලසුම් සහ සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් අරමුණු වෙනුවෙන් සකස් කරනු ලැබිය හැකිය- ඒවා රටක් වෙනුවෙන්, පළාතක් වෙනුවෙන් හෝ තනි නගරයක් හෝ නාගරික ප්‍රදේශයක් වෙනුවෙන් පවා විය හැකිය. ඇතැම් ලේඛන ඉතාම තාක්ෂණික වීමට හෝ තොරතුරු රැසක් අඩංගු ඒවා වීමට ඉඩ ඇති අතර ඒවා අවබෝධ කරගැනීමට ඔබ නාගරික සැලසුම්කරණයේ සහ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂඥයෙකු විය යුතුයැයි පෙනී යාමට ඉඩ ඇත. කෙසේවෙතත, යම් ප්‍රදේශයක් හොඳින්ම දන්නේ එහි වාසය කරන්නන් වන අතර ප්‍රධාන සැලැස්මක් සංරචක වලට වෙන් කිරීමෙන් එම ලේඛන වටහා ගැනීම වඩාත් පහසු වනු ඇත.



**1. ප්‍රධාන සැලැස්ම කවුරුන් වෙනුවෙන්ද?** මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් අපට සම්පූර්ණ ක්‍රියාවලිය හා සම්බන්ධ වනු ඇති ප්‍රධාන ප්‍රජාව හඳුනාගත හැකි වේ. ඇතැම් සැලසුම් මුළු නගරයම ඉලක්ක කරන, යම් විශේෂ කර්මාන්තයක් ඉලක්ක කරන (කෘෂිකර්මාන්තය හෝ ධීවර කර්මාන්තය වැනි) හෝ වීථි වෙළඳුන් වැනි නිශ්චිත ඉලක්ක කණ්ඩායමක් සහිත ඒවා විය හැකිය. මෙම අරමුණු ලේඛනය ආරම්භයේදීම විස්තර කෙරෙන අතර ප්‍රධාන සැලසුම් ක්‍රියාවලිය තුළ සෘජුවම බලපෑමට ලක්වන හා එහි නිරතවන පුද්ගලයන් සහ ප්‍රජාවන් දැන ගැනීමට අපගේ ආරම්භක ස්ථානය මෙය වේ. 'පොදු කාර්යයක්.වෙනුවෙන් රජය විසින් ඉඩම් අත්පත් කරගැනීමක් වේ නම්, යෝජිත ව්‍යාපෘතිය සැබැවින්ම පොදු කාර්යයක් වන්නේද නැතිද යන්නට පිළිතුරු දිය හැකි හොඳම කණ්ඩායමද මොවුන් වන බැවින්ද මෙය වැදගත්ය.



**2. ප්‍රධාන සැලැස්මට අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ කවුරුන් විසින්ද?** මෙම වැදගත් තොරතුර ආරම්භයේදී පහසුවෙන් ප්‍රවේශ විය නොහැකි තොරතුරු රැසක් කරා අපව මෙහෙයවිය හැකිය. රජය විසින් මුදල් සම්පාදනය කරනු හෝ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන කවර හෝ ව්‍යාපෘතියක්, තොරතුරු දැනගැනීමේ අයිතිය ඇති පුරවැසියන් ලෙස (ශ්‍රී ලංකාවේ ඔබේ තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාවේ යෙදවීම පිළිබඳව ෆ කොටස බලන්න) මහජන මුදල් භාවිතා කරන සංවර්ධන සැලැස්මක් පිළිබඳව වැඩි දුර තොරතුරු ලබා ගැනීමට  අපට හැකියාව ලබා දෙයි.

බහුපාර්ශ්වික බැංකුවක් විසින් සංවර්ධන ව්‍යාපෘතියකට අරමුදල් සම්පාදනය කෙරෙන්නේ නම්, ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය

(නාගරික සංවර්ධන අධිකාරිය හෝ මාර්ග සංවර්ධන අධිකාරිය වැනි) අනුගමනය කිරීම අපේක්ෂා කෙරෙන ඇතැම් නෛතික බැඳීමට යටත් කරවන ක්‍රියාවලි තිබේ. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වැනි බැංකු වල අනුගමනය කළ යුතු ආරක්ෂක ප්‍රතිපත්ති, දුක්ගැනවිලි වලට පිළියම් යාන්ත්‍රණ සහ තොරතුරු හෙළි කිරීමේ ප්‍රතිපත්ති ඇත. ඔවුන්ගේ වෙබ් අඩවි වලින් මෙම ව්‍යාපෘති ලේඛනවලට ප්‍රවේශ විය හැකි අතර (වැඩිදුර තොරතුරු වෙනුවෙන් ෧ කොටස බලන්න) ඔබ වැඩි විස්තර දැන ගැනීමට උත්සාහ කරන ව්‍යාපෘති පිළිබඳව වැඩියෙන් තොරතුරු සපයනු ඇත. ආරක්ෂක ප්‍රතිපත්ති නීතිකව බන්ධනීය වන අතර සංවර්ධන ව්‍යාපෘති වලින් ජනතාව සහ පරිසරය ආරක්ෂා කිරීමට ඒවා යොදවනු ලැබ ඇතිබලපෑමට ලක් වූ කණ්ඩායම් හෝ සිවිල් සමාජය ඔවුන්ගේ අයිතිවාසිකමක් උල්ලංඝණය වනු ඇති බව, අයිතිවාසිකමක් උල්ලංඝණය වී ඇති බව, සංවර්ධන ව්‍යාපෘතිය නරක ප්‍රතිඵලයක් ඇති කරනු ඇති හෝ ඇති කරන බව සිතන්නේ නම් පැමිණිලි කිරීමට (නිර්නාමිකව පවා) දුක්ගැනවිලි වලට පිළියම් යාන්ත්‍රණය ඉඩ සලසයි. පිළියම් ලබා ගැනීම සඳහා ඔබට ශ්‍රී ලාංකික නීතිද යොදා ගත හැකිය.



**3. අදහස් විමසනු ලැබුවේ කාගෙන්ද?** සැලසුම් කිරීමේ ක්‍රියාවලිය අතරතුරදී අදහස් විමසන ලද වෘත්තිකයන් සහ කණ්ඩායම්වල ලැයිස්තුවක් ඇතැම් සංවර්ධන සැලසුම්වල ඇත. ව්‍යාපෘතිය පිළිබඳව වැඩි විස්තර මෙම පුද්ගලයන් හෝ කණ්ඩායම් සතුව තිබීමට ඉඩ ඇති අතර ඔවුන් සමඟ සාකච්ඡාවක් ලබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇතිනාගරික සංවර්ධන අධිකාරී වෙබ් අඩවිය වැනි රජයේ වෙබ් අඩවි සහ පළාත් පාලන ආයතන වෙබ් අඩවි පවා මහජන අදහස් වෙනුවෙන් සංවර්ධන සැලසුම් ඉදිරිපත් කරයි. මෙම ලේඛන භාෂා තුනෙන්ම තිබිය යුතු අතර ඔබ වඩා කැමති භාෂාවකින් පිටපතක් ඉල්ලීමට ඔබට අයිතිය තිබේ. සැලසුම් නිර්මාණ හෝ ක්‍රියාත්මක කිරීමේ අදියර අතරතුරදී වැදගත් කණ්ඩායම්වල හෝ සෘජුවම බලපෑමට ලක්වන ප්‍රජාවන්ගේ පවා අදහස් විමසනු ලැබ නොමැති බව ඔබ සිත්නේ නම්, ඔවුන්ගේ හඬ ඇතුලත් කරනු ලැබීම වෙනුවෙන් ඔබට කථා කළ හැකිය.

**4. සෑම දෙයක්ම ප්‍රශ්න කරන්න.** යමක් ප්‍රධාන සැලැස්මක අඩංගු වූ පමණින් තොරතුරු නිවැරදි බව එයින් අදහස් නොවේ. දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය මත පදනම්ව ඇති ආකාරයටද තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය හැකි නමුත් තොරතුරු ඉදිරිපත් කිරීමට වෙනස් නිර්වචන හෝ භාෂාව භාවිතා කරනු ලැබිය හැකියීදත්ත වල සඳහන් වන ජනතාව සහ ස්ථාන වෙත යාමට සිදු වූවත්, හැමවිටම දත්ත මූලාශ්‍රය සහ යෙදුම්වල නිර්වචන පවා පරීක්ෂා කරන්න.

උදාහරණයක් ලෙස, 2012 සිට කොළඹ නගරය වෙනුවෙන් සංවර්ධන සැලසුම් අඩු ආදායම් ලාභීන්ගේ ජනාවාස 'අඩු පහසුකම් සහිත', 'නීති විරෝධී පදිංචිකරුවන්', හෝ 'මුඩුක්කු සහ පැල්පත්' වාසීන් ලෙස සඳහන් කරයි. නාගරික සංවර්ධන අධිකාරිය එබදු ජනාවාස වල නිවාස සංඛ්‍යාව සහ ජීවත්වන පවුල් සංඛ්‍යාව පවා පිළිබඳ දත්ත සංවර්ධන සැලසුම් තුළ ඉදිරිපත් කළ අතර නාගරික සංවර්ධන අධිකාරිය අධිකාරිය විසින් ඉදි කරන ලද මහල් නිවාස වල ඔවුන්ව පදිංචි කරවීමෙන් ඔවුන් නගරය සංවර්ධනය කිරීමද සිදු කරන අතරම අඩු ආදායම් ලාභී ප්‍රජාවන්ට වඩා හොඳ නිවාස තත්ත්වයන් සපයනු ඇති බව ලේඛනයෙහි අරමුණු ප්‍රකාශ කළේය, කෙසේවෙතත්, කොළඹ මහ නගර සභාව සහ සිවිල් සමාජය ප්‍රකාශ කරන ආකාරයට කොළඹ නගරය තුළ අඩු ආදායම් ලාභී ප්‍රජාවන්ගෙන් බහුතරය ස්ථිර ලෙස වැඩිදියුණු කරන ලද නිවෙස්වල ජීවත්වන අතර 'අඩු පහසුකම් සහිත' හෝ 'මුඩුක්කු' ලෙස වර්ගීකරණය කෙරෙන නිවාස ඔවුනට නොමැති බැවින් මෙය නිවැරදි නොවේ. එබැවින්, කොළඹ නගරය තුළ නාගරික පුනර්ජනනයට එරෙහි අධිවාචනය රජය විසින් උවමනාවෙන්ම වැරදි ලෙස හංවඩු ගැසීම මගින් ප්‍රජාවන්ගේ අසාධාරණ භුක්තිය පැහැර ගැනීම මත පදනම්ව ඇත.

**5. සැලැස්ම තිබෙන්නේ සිතියමේ කොතැනද?** ව්‍යාපෘතිය අවසන් කළ විට දිස්වන ආකාරය දක්වන රූප බොහොමයක් සංවර්ධන සැලසුම්වල තිබෙනු ඇත. සංවර්ධනය සිදු කෙරෙන ප්‍රදේශද ඒවා පෙන්නුම් කරයි. ගූගල් මැප්ස් වැනි මෙවලම් භාවිතා කිරීමෙන් ඔබට ප්‍රධාන සැලැස්මේ දැක්වෙන ස්ථානම බලා එය දැන් ඔබ දකින දේ සමඟ සැසඳිය හැකිය. ඔබ ඇසිය යුතු ප්‍රධාන ප්‍රශ්න අතරට පහත දැක්වෙන දේ අයත් වේ.

පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ තුළ හෝ ආසන්නයේ නව යටිතල පහසුකම් හෝ ගොඩනැගිලි යෝජිත සැලැස්මේ තිබේද? දැනට නිවාස හෝ කෘෂිකාර්මික ඉඩම් පවතින ප්‍රදේශවල ඒවා පිහිටා තිබේද? වීථි වෙළඳුන් සිටිනු ඇත්තේ කොහේද? යෝජිත සැලසුම්වලට අදාල භූමිභාගයට එබඳු ව්‍යුහයන් දැරිය හැකිද? නව සැලසුම් ක්‍රියාත්මක කළ හැකි වීම පිණිස ප්‍රදේශයේ සිදු කිරීම අවශ්‍ය වෙනත් වෙනස්කම් මොනවාද? උදාහරණයක් ලෙස, යෝජිත සැලැස්ම ක්‍රියාත්මක කළ හැකි වීම පිණිස ඇතැම්විට නව මාර්ගයක් හෝ අධිවේගී මාර්ගයක් පවා ඉදිකිරීම අවශ්‍ය වනු ඇත. ඉඩම් අත්පත් කරගැනීම සහ ඉදි කිරීම ජනතාවට නිවාස හෝ ජීවනෝපාය අහිමි කරවනු ඇතිද?




**6. පිහිටීම් පරීක්ෂා කරන්න.** මිනිසුන් ඔවුන්ගේ ඉඩම් වලින් ඉවත් කිරීම අවශ්‍ය නොවන නමුත් ඒ හා සමානවම ගැටළු සහගත නව ගොඩනැගිලි හෝ යටිතල පහසුකම් ඇතැම් සැලසුම් යෝජනා කරයි. උදාහරණයක් ලෙස කොළඹ, පිටකොටුවේ පිහිටා තිබූ එළවළු, පළතුරු සහ මාළු තොග වෙළඳපොල 2021 දී පෑලියගොඩට ගෙන යන ලදී. නව වෙළඳපොල වඩා විශාල, හිස් ඉඩමක ගොඩ නගන ලද හා පහසුකම් රැසක් සහිත එකකි. කෙසේවෙතත්,එය පොදු ප්‍රවාහනය හා සම්බන්ධ කර නොමැත. එළවළු වෙළඳපොලට වැඩියෙන් ස්වාභාවික ආලෝකය නොලැබෙන ලෙස ඉදිකර තිබෙන අතර වෙළඳුන්ට දවස පුරාම විදුලි පහන් දල්වා තැබීමට සිදු වන බව එයින් අදහස් වේ. සාප්පුවල ඉඩ ප්‍රමාණවත් නොවන අතර ගබඩා සහ සිසිලන පහසුකම් ප්‍රමාණවත්ව සපයා නොමැත. ට්‍රක් රථවල සිට සාප්පුවලට භාණ්ඩ ප්‍රවාහනය අපහසුයීමෙයින් අදහස් වන්නේ වෙළඳුන්ගේ වියදම් ඉහළ ගොස්, ඔවුනට පාරිභෝගිකයන් අහිමි වී ඔවුන්ගේ ආදායම් අඩු වී ඇති බවයි.



**7. ප්‍රජාවන් සහිත සිතියම.** භූමිය පිළිබඳව හොඳම අවබෝධය තිබෙන්නේ එම අවකාශය සෘජුවම භාවිතා කරන්නන්ට සහ එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවටයියෝජිත ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිවිපාකවල වඩාත් සියුම් විස්තර වටහා ගැනීම සඳහා ඔවුන් සමඟ සිතියම් සැසඳීමේ අභ්‍යාස සිදු කර අදාල කොටස් කියවන්න. කාන්තාවන්, පිරිමින් හා ළමුන්, විවිධ වයස් කාණ්ඩවල ජනතාව, වෙනස් රැකියාවන් වල නියුතු ජනතාව ආදී වශයෙන් විවිධාකාර පුද්ගලයන් එක් කර ගැනීම යෝජිත සැලැස්ම වඩාත් පරිපූර්ණ ලෙස

වටහා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.



**8. විකල්ප ඉදිරිපත් කරන්න**. ප්‍රධාන සැලැස්මේ වර්ගය මත පදනම්ව ඇතැම්විට එය මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමට වඩා එය වැඩිදියුණු කිරීම වැඩි ප්‍රතිලාභ අත්කර දීමට ඉඩ ඇත. බලපෑමට ලක්වන ප්‍රජාවන්ගේ, නීතීඥයන්ගේ, විෂය පිළිබඳ විශේෂඥයන්ගේ සහ තාක්ෂණික කරුණු සහ ඇළීම් සම්බන්ධයෙන් පවා උපකාර විය හැකි සැලසුම් ශිල්පීන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් වැනි වෘත්තිකයන්ගේ අදහස් විමසීමෙන්, පුරවැසියන්ගේ සැබෑ අවශ්‍යතා පිළිබිඹු කරන, ජනතාවට හෝ පරිසරයට හානි නොකරන සහ මුලින් යෝජිත සැලැස්මෙන් ඇති විය හැකි සෘනාත්මක බලපෑම් ඇති නොකරන, එම ප්‍රතිඵලයම අත් කර ගැනීමට වඩා හොඳ ක්‍රමයක් අපට යෝජනා කළ හැකියීමේ සඳහා අපට වෙනත් නගරවල හෝ රටවල අත්දැකීම් දෙස බලා ඒවායින් ඉගෙනගෙන යෝජිත ප්‍රධාන සැලසුම පිළිබඳව නැවත සිතීම කළ හැකියීවෙනත් නගර හෝ රටවල් වෙතින් සිද්ධි අධ්‍යයන රැස් කිරීම අප යමක් ප්‍රතික්ෂේප කරන්නේ හෝ විකල්පයක් යෝජනා කරන්නේ කුමක් නිසාද යන්න පැහැදිලි කිරීමටද ඉතා සඵලදායක ක්‍රමයකි.



**9. සඵලදායක ව්‍යාපාරයක් ගොඩනැගීම**. ඔබ ප්‍රධාන සැලැස්මක් ප්‍රතික්ෂේප කරන්නේ හෝ එය වැඩිදියුණු කිරීමට උත්සාහ කරන්නේ වුවත්, සඵලදායක ව්‍යාපාරයකට ප්‍රධාන සංරචක කිහිපයක් ඇත. මුලින්ම, ඔබ ඔබේ ව්‍යාපාරය පදනම් කරගන්නා තොරතුරු නිවැරදි, යාවත් කාලීන සහ ජනතා කේන්ද්‍රීය විය යුතුය. ඇතැම්විට අපට සියළු තොරතුරු කලට වේලාවට සපයා ගැනීමට නොහැකි වීමට ඉඩ ඇති අතර එවැනි අවස්ථා වලදී බලපෑම අවධාරණය කිරීම සඳහා ජනතාව සහ ප්‍රජාවන් වෙතින් ලැබෙන තොරතුරු වැදගත් වනු ඇත. ජනතාවගෙන් තොරතුරු රැස් කිරීම සඳහා ඔබට ප්‍රශ්නාවලි සහ සහභාගිත්ව ක්‍රීඩා වැනි දත්ත රැස් කිරීමේ මෙවලම් භාවිතා කළ හැකිය.

දෙවනුව, ඔබ රැස් කර ගන්නා තොරතුරු වලට සංකීර්ණ කථාවක් කීමේ හැකියාව තිබිය යුතුය. විශේෂයෙන්ම බලපෑම් පිළිබඳව කථා කරන විට, 'මෙතරම් සංඛ්‍යාවක් ජනතාවට නිවාස අහිමි වනු ඇත. හෝ 'මෙතරම් සංඛ්‍යාවක් ජීවනෝපාය බලපෑමට ලක් වනු ඇත.

කීම ප්‍රමාණවත් නොවනු ඇත. බුත්තිය තොර කිරීම සහ ආදායම අහිමි වීම ඊළඟ පරම්පරාව තෙක් දිවෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයට බලපාන ආකාරය, එය පවුල්වල පෝෂණයට හා සෞඛ්‍යයට බලපානු ඇති ආකාරය එම කථාවෙන් කියවිය හැකිය. ජීවනෝපාය වෙනස්වීම් වඩා පුළුල් අගය දාම, සමාජ ආරක්ෂාව, දේශගුණික විපර්යාස හෝ ආහාර පරිසරය මත බලපෑම් ඇති කළ හැකි ආකාරයද එයට කථා කළ හැකිය.

උදාහරණයක් ලෙස□ කොළඹදී අප අඩු ආදායම් ලාභී ප්‍රජාවන් මත යටිතල පහසුකම් ව්‍යාපෘතිවල බලපෑම සම්බන්ධයෙන් කථා කරන විට අප කී දෙනෙකුට ඔවුන්ගේ නිවාස අහිමි වී තිබේද යන්න සඳහන් කරන අතරම තොග වෙළඳපොල වෙනත් තැනකට ගෙන යාම (ඉහත සඳහන් කරන ලද) නැවුම් නිෂ්පාදන වල මිළ ඉහළ යාමටත් මෙම ප්‍රජාවන්ට ඒවා මිළ දී ගැනීම වඩා අසීරු වීමටත් හේතු වී ඇති ආකාරය සහ එය ඔවුන්ගේ පෝෂණයට බලපාන ආකාරයද, මෙම නැවත පදිංචි කිරීම් පාසලට හා වැඩ කරන ස්ථානයට යාමේ ගමන් වියදම් වැඩි කර ඇති ආකාරය සහ ඔවුන් ගමන් වියදම් වෙනුවෙන් පරිභෝජනය සීමා කිරීම හෝ ප්‍රවාහන වියදම් දැරීමට නොහැකි වීම නිසා දරුවන් දිනපතා පාසල් නොයැවීම එයින් අදහස් වන බවද අපි කථා කරන්නෙමු.



**10. මිත්‍ර පාර්ශ්ව සොයා ගන්න.** ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය වේවා, රටේ වෙනත් ප්‍රදේශවල බලපෑමට ලක් වූ සමාන කණ්ඩායම් වේවා, ඔබේ ව්‍යාපාරයේ හඬ වැඩි කළ හැකි පමණක් නොව ඔබට ඔවුන් වෙතින් උගත හැකිද වන මිත්‍ර පාර්ශ්ව සොයා ගැනීම වැදගත්යිසමාන සංවර්ධන ව්‍යාපෘති අත්දැක ඇති වෙනත් ප්‍රජාවන්ගේ අත්දැකීම් තුලින් අපට ඉගෙන ගත හැකි පාඩම් මොනවාද? වඩා පුළුල් සන්ධානයක් ගොඩ නැගීම සඳහා දැනට පවතින ව්‍යාපාර හෝ සමාන සංවර්ධන ව්‍යාපෘති අපට අපේ ව්‍යාපාරයට සම්බන්ධ කරගත හැකි වන්නේ කෙසේද? ව්‍යාපාරයක් තිරසාරව පවත්වා ගැනීම සහ එය අඛණ්ඩව ගොඩ නැගීම හුදකලාව කිරීම දුෂ්කර වන අතර වෙනත් ජාල සහ ව්‍යාපාර සමඟ සම්බන්ධ වීම ප්‍රයෝජනවත්ය.

# ඔබට ඉවත්වන ලෙස දැනුම් දෙනු ලැබ තිබේද?

# ඔබේ හිමිකම් සුරක්ෂිත කරගැනීම වෙනුවෙන් ප්‍රායෝගික පියවර සහ ප්‍රතිචාර



**ඉක්මනින් ක්‍රියා කරන්න. ඔබේ ඉඩම ආපසු ලබා ගැනීම හෝ විකල්ප ඉඩමක් ලබා ගැනීම සහ අහිමි වූ දේපලට වන්දි ලබා ගැනීම තහවුරු කිරීමට කථා කිරීම සහ සහාය පැතීම කරන්න.**

සියළු ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග වේගවත් කිරීමට ඔබේ අයිතිය ඔප්පු කිරීම පිණිස නිවැරදි තොරතුරු සහ ලිපි ලේඛන ඔබ සතුව ඇති බවට වගබලා ගන්නීඔබේ ඉඩම වෙනුවෙන් වලංගු ලිපිලේඛන ඔබ සතුව තිබීම වැදගත්ය. අවශ්‍ය ලිපිලේඛන ඔබ සතුව නොමැති නම්,අදාල ලිපිලේඛන ලබා ගන්නා ආකාරය පිළිබඳව නීති උපදෙස් ලබා ගැනීමට වගබලා ගන්න.

ඔබට ඉඩම අයිති නැති වුවත්, ඔබට ඉවත් වන ලෙස දැනුම් දෙනු ලැබ ඇත්නම් ඔබ අනාථභාවයට පත් නොවනු පිණිස ඔබට විකල්ප නවාතැනක් හා/හෝ වන්දියක් ලබා දීමේ වගකීමක් රාජ්‍යය සතු වීමට ඉඩ ඇත. ඔබ පදිංචිව සිටි කාලය සහ පදිංචියේ ස්වභාවය ඇතුළුව සිද්ධියට අදාල කරුණු සහ තත්ත්වයන් මත මෙය රඳා පවතිනු ඇති අතර ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමේ හොඳම ආකාරය පිළිබඳව ඔබ නීති සහ වෙනත් උපදෙස් ලබා ගත යුතු වේ. පුද්ගලික දේපල හෝ නිවාස වලට අයිතිවාසිකම වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ව්‍යක්ත ලෙස විධිවිධාන සලස්වනු ලැබ නොමැති බව සැලකිල්ලට ගැනීම වැදගත් වන අතර එබැවින් අදාල රාජ්‍ය බලධරයා හා/හෝ සිද්ධිය අධිකරණයට ගෙන යනු ලැබුවහොත් අධිකරණය සමඟ එම කරුණ ප්‍රමන්ත්‍රණය කෙරෙන ආකාරය මත ප්‍රතිඵලය පදනම් වනු ඇත.

අයිතිය තහවුරු කිරීමේදී, ඇතැම්විට ඔප්පු නොමැති පුද්ගලයන් සතුව ඉඩමේ ඔවුන්ගේ පදිංචිය ඔප්පු කරන බදු ගෙවීම් ලේඛන සහ ජල, විදුලි බිල්පත, ග්‍රීන් කාඩ් ආදිය ඇතුළුව වෙනත් ලියකියවිලි සහ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ ආකෘතිපත් තිබිය හැකියි අවාසනාවකට මෙන්, වර්තමාන නීතිය යටතේ, මෙම ලිපි ලේඛන

ඉඩමට කිසිදු අයිතිවාසිකමක් පෙන්නුම් නොකරයි.

අදාල සියළු තොරතුරු ඔබට ලබාදෙන ලෙස අදාල බලධරයා වෙත වාචික සහ ලිඛිත ඉල්ලීම් කරන්න. තොරතුරු ලිඛිතව ලබාදෙන ලෙස එකහෙලා ඉල්ලා සිටින්න.

ඔබට ඉවත්වන ලෙස පවසන්නේ කවුද (ඒ රාජ්‍ය ආයතනයක්ද- ඒ අධිකරණයක්ද, පුද්ගලික තැනැත්තෙක්ද?)

- බලධරයා සඳහන් කරන කවර හෝ ගැසට් පත්‍රයෙ,නිවේදනයේ, රජයේ බලධරයාගේ තීරණයේ පිටපතක් ඉල්ලන්න.
- ඔබේ ඉඩම බලපෑමට ලක්වන්නේ කුමක් නිසාද/නෙරපීමට හේතුව? රාජ්‍යයට ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ පුද්ගලික ඉඩමක් අත්පත් කරගත හැක්කේ පොදු කාර්යයක් වෙනුවෙන් පමණි. අත්පත් කරගන්නා අවස්ථාවේදී කාර්යය හෙළි නොකිරීම රාජ්‍යයේ පිළිවෙත වී ඇති අතර,පොදු කාර්යය හෙළි කළ යුතු බවටත් එම කාර්යය ජනතාවට ප්‍රතිලාභ අත් කර දිය යුතු බවටත් ශ්‍රී ලංකාවේ අධිකරණ තීන්දු කර ඇතිඑබැවින් ඔබට ඔබේ විරෝධතා පැහැදිලිව ඉදිරිපත් කළ හැකි වන පරිදි බලපෑමට ලක්වන සියල්ලන්ට පොදු කාර්යය හෙළි කරන ලෙස බලධරයාගෙන් මුල සිටම ඉල්ලා සිටීම වැදගත් වේ.
- රජයේ බලධරයා නැවත පදිංචි කිරීමේ විකල්ප සපයා තිබේදැයි විමසන්නීඑසේ කර තිබේ නම්,විකල්ප වාසස්ථානයේ හෝ ඉඩමේ වර්ගය, පිහිටීම, වටිනාකම, පහසුකම්,සේවා කරා ප්‍රවේශය පිළිබඳ විස්තර ඉල්ලා සිටින්නී එවිට ඔබ අත් හරින ඉඩම සහ දේපල ඒ වෙනුවට ඔබට ලැබෙන ඒවාට වඩා වටිනා බවට සාකච්ඡා කිරීමට හා පැහැදිලි කිරීමට ඔබ වඩා හොඳ තත්ත්වයක සිටිනු ඇත.
- වන්දි මුදල කීයද? එය ගණනය කරනු ලබන්නේ කෙසේද? හවුල් අයිතිය එය සැලකිල්ලට ගන්නේද? (නැවත පදිංචි කිරීමටද අදාල වේ) එය කලට වේලාවට සහ විනිවිද භාවය සහිත ආකාරයෙන් ගෙවනු ලබන්නේද?

ඔබට යම් ලියවිල්ලකට අත්සන් තබන ලෙස පවසනු ලැබුවහොත් එය ඔබට තේරෙන භාෂාවෙන් තිබෙන බවට, ඔබ එය ප්‍රවේශමෙන් කියවා බලන බවට සහ ඔබේ වාර්තා වෙනුවෙන් ඔබ එහි පිටපතක් ඉල්ලුම් කරන බවට වගබලා ගන්න. ඔබට නොතේරෙන කිසිදු ලේඛනයක් ඔබ අත්සන් නොකළ යුතු අතර අත්සන් කිරීමට පෙර නීතීඥවරයකුගේ හෝ ඔබ තෝරාගන්නා කවර හෝ තැනැත්තෙකුගේ උපදෙස් පැතීමට ඔබට අයිතිය තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ (22 (2) ව්‍යවස්ථාව) පරිපාලන භාෂාව සිංහල වුවත් (කොළඹදී එය එසේය) සිංහල හෝ දෙමළ වේවා ඔබ තෝරා ගන්නා භාෂාවෙන් කවර හෝ නිල ලිපිලේඛන ලැබීමට ඔබට අයිතිය ඇත. මුල්පිටපත ඔබ කැමති භාෂාවෙන් නිකුත් කරන ලෙස ඉල්ලීමට හෝ පරිවර්තනයක් ඉල්ලීමට ඔබට අයිතිය ඇත. ඔබ කවර හෝ නිල ලිපිලේඛන පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන්නේ නම් එවිටද මෙම අයිතිය අදාල වේ.

ප්‍රායෝගිකව, ඔබ අත්සන් කරන කවර හෝ ආකෘති පතක් ඔබේ අභිප්‍රායයන් පිළිබිඹු කරන බවටත්, ඔබේ අයිතිවාසිකම් වලට හානි නොකරන බවටත් ඔබ වගබලා ගත යුතුය. උදාහරණයක් ලෙස 'විකල්ප ඉඩම් ඉල්ලීම් ක ආකෘතියෙන් වන ආකෘති පතක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධනය වෙනුවෙන් සලකුණු කරන ලද ඉඩම් හිමි තැනැත්තන් අතර සංසරණය වෙමින් පවතී. ජනතාව විකල්ප ඉඩම් වෙනුවෙන් ඔවුන්ගේ දේපල හැර යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ බවට අදහසක් මෙම ආකෘති පත ලබා දෙයි. එය මුළුමනින්ම නීති විරෝධී නොවන නමුත,අත්සන් කළ බොහෝ දෙනෙකු සඳහන් කරන්නේ අත්සන් කරන අවස්ථාවේදී ඔවුනට ආකෘති පතේ කාර්යය සහ ඉන් ඇඟවෙන දේ පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා නොදුන් බවයි. කිසිවක් අත්සන් කිරීමට පෙර ලේඛනයේ පිටපතක් ලබාගෙන උපදෙස් ලබා ගැනීමට ඔබට ඉඩ ලබාදෙන ලෙස ඉල්ලීම සාධාරණය.

විරෝධතා ගොනු කරන්නීඔබට ඉවත් වන ලෙස පවසන රාජ්‍ය ආයතනයට හෝ අධිකරණ නියෝගයක් තිබේ නම් අධිකරණයට ඔබට විරෝධතා ගොනු කළ හැකියීහැමවිටම හැකි තාක් ඉක්මනින් ලිඛිත පැමිණිලි ඉදිරිපත් කරන්න, ප්‍රමාදයන් ඔබේ අයිතිවාසිකම් වලට නරක බලපෑම් ඇති කිරීමට ඉඩ තිබේ.

රාජ්‍යය ඔබට අසාධාරණ ලෙස සලකා ඇති බව හෝ නීතියට අනුව කටයුතු කර නොමැති බව ඔබ විශ්වාස කරන්නේ නම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ගොනු කිරීමට වගබලා ගන්න (ඔබේ පැමිණිල්ල නිල වශයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති බව මෙයින් සහතික කෙරෙන අතර ඔබ පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් අයැදුමක් ගොනු කිරීමට අපේක්ෂා කරන්නේ නම් එයට හැකියාව ලබා දෙනු ඇත. කවර හෝ මූලික අයිතිවාසිකම් අයැදුමක් අයිතිවාසිකම උල්ලංඝනය කරනු ලැබීමේ සිට මසක් ඇතුළත ගොනු කරනු ලැබිය යුතුය; කෙසේවෙතත් එම කරුණ සම්බන්ධයෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ විමර්ශනයක් ලැඹියාව අතරතුරදී මෙම කාල අවුරුව අත්හිටවනු ලැබේ.

කවර හෝ රාජ්‍ය නිලධාරියෙකු හෝ ආයතනයක් විසින් ලබාදෙනු ලබන වාචික පුනආරක්ෂණ/පොරොන්දු වලට අධිකරණයකදී ඇත්තේ අල්ප වටිනාකමකි. සියළු කරුණු සම්බන්ධයෙන් ඔබට ලිඛිත සන්නිවේදන ලැබෙන බවට ඔබ වගබලා ගැනීම වඩාත් සුදුසුයීකිසිදු නිල පැමිණිල්ලක් නොකරන ලෙස හෝ නඩුවක් නොපවරන ලෙසත් හා එවිට ඔබේ කරුණ නිරවුල් කරනු/ බේරුම් කරනු ලබනු හෝ එයට විසඳුම් සපයනු ලබනු ඇති බවත් ඔබට පවසනු ලැබීමට පවා ඉඩ ඇතිපැමිණිලි ප්‍රමාද කිරීම නීතියට අනුව අවදානම් සහගතය. ඔබේ දුක්ගැනවිල්ලට රාජ්‍යයේ විසඳුම සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත්වන්නේ නම්, කවර හෝ පැමිණිල්ලක් ඉල්ලා අස්කර ගැනීමේ අයිතිය ඔබට හැම විටම ඇත.

# තොරතුරු දැනගැනීමේ අයිතිය අයැදුමක් ගොනු කිරීම



## තොරතුරු දැනගැනීමේ අයිතිය යනු කුමක්ද?

තොරතුරු දැනගැනීමේ අයිතිය යනු රජයේ බලධාරීන් සතු තොරතුරු ලබා ගැනීමට ඔබේ මූලික අයිතිවාසිකම වේ.

රටේ පුරවැසියන් වෙනුවෙන් විශ්වසනයෙන් දරන තොරතුරු රැසක් රජයේ බලධරයන් සතුයිපුරවැසියන් ලෙස,මෙම තොරතුරු කරා ප්‍රවේශ වීමට දැන් ඔබට මූලික අයිතිවාසිකමක් තිබේ. 2016 අගෝස්තු මස 4 වැනි දින සම්මත කරන ලද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මෙම තොරතුරු කරා ප්‍රවේශ වීමට පුරවැසියන්ට භාවිතා කළ හැකි ක්‍රියාවලිය නියම කරයි. එය අදාල පොදු අධිකාරියට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ සරල ක්‍රියාවලියකි. සාමාන්‍ය ක්‍රියාවලිය සමඟ උපරිම වශයෙන් දින 28 ක් ඇතුළත ඔබට තොරතුරු ලැබිය යුතුය (තොරතුරු විශාල ප්‍රමාණයක් නම්, හෝ විවිධ ස්ථාන වලින් ලබා ගත යුතු නම්, එයට තවත් දින 21 ක් දක්වා හෝ එයට වැඩි කාලයක් ගත වීමට ඉඩ ඇත).

ඔබ ඉල්ලුම් කරන තොරතුරු පෞද්ගලිකව ඔබට සම්බන්ධ වීම අවශ්‍ය නොවේ. වෙනත් කවර හෝ පොදු තොරතුරු ඔබට ඉල්ලා සිටිය හැකියිඑය ඔබේ පාර්ශ්වයෙන් අයිතියක් මෙන්ම වගකීමකි. තොරතුරු දැන ගැනීමේ අයිතිය හරහා, ඔබට  මෙන්ම පොදු ජනතාවට, ඔබේ වටපිටාවට, ප්‍රජාවට හෝ රටට වැදගත් වන තොරතුරු ඉල්ලුම් කිරීම තුළින් ඔබට පාලනයට සහභාගි විය හැකිය.

ඔබට ඉල්ලුම් කළ හැකි තොරතුරු එහි භෞතික ආකාරය හෝ ස්වභාවය කුමක් වුවත්, වාර්තා, ලිපිලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල් පණිවුඩ, මත, උපදෙස්, පුවත් නිකුතු, චක්‍රලේඛ, නියෝග, ලොග් සටහන් පොත්, ගිවිසුම්, වාර්තා, පත්‍රිකා, නියැදි, ආකෘත, ලිපි හුවමාරු, කෙටුම්පත් නීති, පොත්, සැලසුම්, සිතියම්, චිත්‍ර, රූප සටහන්, චිත්‍රමය හෝ ග්‍රාපික නිර්මාණ,ඡායාරූප෴ චිත්‍රපට, ක්ෂුද්‍ර චිත්‍රපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි පටිගත කළ දේ, පරිගණක දත්ත සහ අනෙකුත් වාර්තා ඇතුළු ඕනෑම ආකාරයකින් සහ එවැන්නක පිටපතක ආකාරයෙන් විය හැකිය.

තොරතුරු ඉල්ලුම් කිරීමට ඔබ හේතු දැක්වීම අවශ්‍ය නොවන අතර ඔබෙන් හේතු දක්වන ලෙස ඉල්ලීමද කළ නොහැකිසම්පූර්ණ කළ යුතු විශේෂ ආකෘති පතක් නොමැති අතර ඔබ කළ යුත්තේ අවශ්‍ය තොරතුරු වල විස්තර සහ ඔබට එය ලිඛිතව අවශ්‍ය (ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික) ස්වභාවය (ලිපියක්, සංයුක්ත තැටියක් ආදී) භාෂාව ලබා දීම පමණි.

## මට තොරතුරු ඉල්ලුම් කළ හැක්කේ කාගෙන්ද?

## මා යා යුත්තේ කවුරුන් වෙතද?

සෑම පොදු අධිකාරියකම තොරතුරු නිලධාරී

## පොදු අධිකාරී යනු මොනවාද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ කවර හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද කවර හෝ තැනැත්තෙක කාර්යාලයක් හෝ ආයතනයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් සහ රජය විසින් සපයන ලද බලපත්‍රයක් යටතේ ක්‍රියාත්මක වන හෝ පොදු කාර්යයන් හෝ සේවා සපයන පුද්ගලික සංවිධානයක් හෝ අධිකාරියකී පහත සඳහන් දේ මෙයට ඇතුළත්ය:

- අමාත්‍යාංශ
- රජයේ දෙපාර්තමේන්තු
- රාජ්‍ය සංස්ථා
- පළාත් පාලන ආයතන
- රජයේ මුදලින් නඩත්තු කෙරෙන උසස් අධ්‍යාපන ආයතන
- නීතිය යටතේ පිළිගත් හෝ යම් තාක් දුරට රජයේ මුදලින් නඩත්තු කෙරෙන පුද්ගලික අධ්‍යාපනික ආයතන

## අපට මෙම පනත යටතේ පැමිණිලි කළ හැකිද? ඒ කෙසේද?

ඔව්.

තොරතුරු නිලධරයා හෝ නම් කළ නිලධරයා තොරතුරු ලබා දීම ඔනෑකමින්ම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ මෙම පනත යටතේ විධිවිධාන සලස්වනු ලැබ ඇති ඔවුන්ට පැවරුණු වගකීම් ඉටු කිරීමට අසමත් වන්නේ නම්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට පැමිණිලි කිරීමට පුරවැසියන්ට හැකියාව තිබෙන අතර ඔවුන් අදාල විනය බලධරයා ක්‍රියාමාර්ග ගැනීමට මෙහෙයවනු ඇතීවිනය බලධරයා 1 මසක් ඇතුළත නැවත කොමිෂන් සභාවට වාර්තා කළ යුතුය. තොරතුරු විනාශ කිරීම හෝ වැරදි තොරතුරු ලබා දීම වැනි වඩාත් බරපතල වැරදි වෙනුවෙන්, කොමිෂන් සභාවට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පැවරීමේ හැකියාව ඇත.

## අභියාචනා

ඔවුන් තොරතුරු ලබා නොදෙන්නේ නම්?

- ප්‍රතික්ෂේප කිරීමේ සිට දින 14 ක් ඇතුළත ඔබට නම් කළ නිලධරයාට අභියාචනයක් කළ හැකිය.
- අයැදුම්කරුගේ පාලනයෙන් බැහැර පවතින හේතු නිසා දින දාහතරක් ඇතුළත අභියාචනා කිරීමට අයැදුම්කරු අසමත් වුවහොත්, ප්‍රමාදය වෙනුවෙන් සාධාරණ හේතු ඉදිරිපත් කිරීම මත නම් කළ නිලධරයා අයැදුම භාර ගනු ඇත.
- නම් කළ නිලධරයා සති 2 ක් ඇතුළත තීරණයක් ලබා දිය යුතුය.
- ඔවුන් තීරණයක් ලබා දීමට අපොහොසත් වන්නේ නම් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඔබට මාස 2 ක් ඇතුළත තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවට අභියාචනා කළ හැකිය.
- කොමිෂන් සභාවේ තීරණය දින 30 ක් ඇතුළත-නම් කළ නිලධරයාගේ හෝ තොරතුරු නිලධරයාගේ තීරණය තහවුරු කිරීම, වෙනස් කිරීම හෝ ආපසු හැරවීම කළ හැකිය
- කොමිෂන් සභාවේ තීරණය ලැබීමේ සිට 1 මසක් ඇතුළත අභියාචනා අධිකරණයට අභියාචනය කළ හැකිය.

(මූලාශ්‍රය: RTI Watch, Transparency International Sri Lanka)

# තොරතුරු වෙනුවෙන් සම්පත්

5

රජයේ අමාත්‍යාංශ වෙබ් අඩවි සහ නාගරික සංවර්ධන අධිකාරි වෙබ් අඩවිය හෝ පළාත් පාලන ආයතන වෙබ් අඩවි වැනි රජයේ ආයතනවල වෙබ් අඩවි හරහා පවා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් තොරතුරු කරා ප්‍රවේශ විය හැකිය.තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහා සෘජුවමද ඔබට තොරතුරු ඉල්ලුම් කළ හැකිය.

**වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකි තවත් සම්පත් කිහිපයක් මෙහි දැක්වේ.**

1. ගැසට් පත්‍ර, හැන්සාඩ් වාර්තා සහ විගණකාධිපතිගේ වාර්තා වැනි රජයේ ලේඛන වල පවා ප්‍රයෝජනවත් තොරතුරු රැසක් අඩංගු වේ.ප්‍රදේශ නාම,ව්‍යාපෘති නාම හෝ කුමන හෝ නිශ්චිත තොරතුරු වැනි වැදගත් වචන අනුව සෙවීමෙන් ප්‍රතිඵල අත් වනු ඇත.

http://documents.gov.lk/

https://www.parliament.lk/business-of-parliament/hansards

http://auditorgeneral.gov.lk/

2. ඉහත සඳහන් කළ පරිදි, බහුපාර්ශ්වික බැංකු වෙබ් අඩවි සහ ඒවායේ ශ්‍රී ලාංකික කාර්යාල ඔවුන් විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් තවත් තොරතුරු මූලාශ්‍රයකි.මෙය ඔබට තාක්ෂණික වැඩි නම්, මෙම කරුණු සම්බන්ධයෙන් විශේෂඥ දැනුම ඇති ඔබට සම්බන්ධ විය හැකි සිවිල් සමාජ කණ්ඩායම් සිටී. උදාහරණයක් වශයෙන්, ආසියානු සංවර්ධන බැංකුව හෝ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ඔබට මැනිලා පදනම් කරගත් කණ්ඩායමක් වන ්ඊ පිළිබඳ රාජ්‍ය නොවන සංවිධාන සංසදය ( NGO Forum on ADB) (https://www.forum-adb.org/) ඇමතිය හැකි අතර ලෝක බැංකු ව්‍යාපෘති වෙනුවෙන් ඔබට වොෂිංටන් ඩී.සී. හි කණ්ඩායමක් වන බැංකු තොරතුරු මධ්‍යස්ථානයද (ඊබන ෂබදෙරප්ච්සදබ කැබච්ැර) (http://bankinformationcenter.org) ඉන්දියාවේ මූල්‍ය වගවීම වෙනුවෙන් මධ්‍යස්ථානයද (Centre for Financial Accountability in Indi') (https://www.cenfa.org& ඇමතිය හැකිය.

ලෝක බැංකු ව්‍යාපෘති – https://projects.worldbank.org/en/projects-operations/projects-home

ආසියානු සංවර්ධන බැංකු (ADB) ව්‍යාපෘති - https(//www.adb.org/projects) https://www.adb.org/projects/documents

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු (AIIB) ව්‍යාපෘති – https://www.aiib.org/en/projects/list/index.html

3. චීනය සහ චීන බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් තොරතුරු වෙනුවෙන් https://china.aiddata.org/

4. ඔබ තොරතුරු සොයන්නේ නම් සහ ඔබ සොයන වෙබ් අඩවිය තව දුරටත් නොපවතී නම්, Way Back Machine නම් මෙම වෙබ් අඩවියේ ඔබට සෙවිය හැකි වෙබ් අඩවි සංරක්ෂණාගාරයක් ඇත- https://archive.org/web$

ඔබ සොයන ශ්‍රී ලාංකික වෙබ් අඩවිය Way Back Machine හි නොමැති නම්ල උැමිසවිෟ්ච සෘසින හි අද වන විට නොතිබීමට ඉඩ ඇති ශ්‍රී ලාංකික රජයේ සහ සිවිල් සමාජ වෙබ් අඩවි සංරක්ෂණාගාරයක් ඇත - https://sitesatrisksl.wordpress.com/

PARL
People's Alliance for Right to Land

No. 3 Kynsey Terrace,
Colombo 08,
Sri Lanka.

+94 77 232 3277(Hotline / Whatsapp)

@ParlSl

parlnetworksl@gmail.com